සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education - Western Province மேல் மாகாணக் கல்வித் திணைக்களம்

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

◆ **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) බොර දියේ මාළුන් ඇල්ලීම නොකළ යුතු බව සාමාජිකයෙක් අධ්‍යක්ෂතුමාට කීවේ ය.
(1) දුප්පතුන් පමණක් අල්ලා ගැනීම (2) දැඩි කරදරයෙන් නිදහස් වීම
(3) අවුල් තත්ත්වයෙන් ඵල නෙළා ගැනීම (4) අඳුරෙන් එළියට ඒම

(02) උත්සාහයේ මල් පල හට ගැනීම පිළිබඳ ව ඔවුහු බොහෝ ප්‍රීති වූහ.
(1) චාතුර්යය (2) සාර්ථකත්වය (3) මුහුකුරා යාම (4) සමෝධානය

(03) පිරිහෙමින් පැවැති ආයතනයට නව එළියක් ලබා දුන්නේ තරුණ කළමනාකාරතුමා ය.
(1) අලුත් ආලෝකයක් (2) ආලෝක ධාරාවක්
(3) නව අර්ථ කථනයක් (4) අලුත් දියුණුවක්,

◆ **අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**
(04) බලංගොඩ මෛත්‍රී හිමියන්ට ............... ගැඹුරින් නිරත වීම නිසා ම ප්‍රාචීන භාෂා පිළිබඳ ව නෛපුණ්‍යයක් ලබා ගැනීමට හැකි විය.
(1) ස්වාධ්‍යයනයෙහි ලා (2) කළමනාකරණයෙහි ලා
(3) ස්වතන්ත්‍රයෙහි ලා (4) සමය සමයාන්තරයෙහි ලා

(05) භාෂාව, සංස්කෘතියේ ....................... යනුවෙන් හැඳින්විය හැකි බව මහාචාර්යතුමා පැවසී ය.
(1) උපභාෂාව (2) ශබ්ද සංයුති (3) උපාර්ජනය (4) වාහකය

(06) කාලිදාස කිවිඳු හා කුමාරදාස රජු ........... බව උගතුන්ගේ මතය යි.
(1) අර්ධ කාලීනයන් (2) සමකාලීනයන්
(3) පූර්ණ කාලීනයන් (4) පශ්චාත් කාලීනයන්

(07) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) චතුරිකා, චලනි, චාරුකා, චාන්දනී
(2) කුමාරදාස, කුමාරසිරි, කුමාරතුංග, කුමාරසිංහ
(3) ධර්මදාස, ධර්මරත්න, ධර්මසේන, ධර්මලතා
(4) සමරජීව, සමරනායක, සමරපාල, සමරසේකර

(08) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) භූ ගර්භය, ජණලේඛන, අමානුෂික, සමුළුව
(2) තලාපෙළා, කලකිරීම, ඥාණගවේෂණය, ධෛර්යවත්
(3) සැලකිල්ල, මොනරපිල, කැලඹීම, අර්ථකථනය
(4) අණුපිළිවෙළ, ද්වනිතාර්ථ, පරමාදර්ශ, ආශ්චර්ය

(09) A - අව්‍ය සමාසය — E - අමාබස්
B - විශේෂණ සමාසය — F - ජනප්‍රිය
C - අන්‍යාර්ථ සමාසය — G - කුමන්ත්‍රණ
D - විභක්ති සමාසය — H - දිගැස

ඉහත සමාස වර්ගයට උදාහරණ ගැළපූවිට නිවැරදි වරණය වන්නේ,
(1) E,G,F,H (2) G,E,H, F (3) G,E,F,H (4) H,G,F,E

(10) එක් එක් වචනවල මුල'කුරෙහි කෙටි ඇදපිල්ල, දීර්ඝ ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
(1) සැරසිලි, රැනගිරවා, ස්තූපය, පූර්විකාව
(2) හැකිළුණු, හිරුමඬල, හැවිල්ල, නොපැකිළ
(3) වින්නැහිය, පෑතැටිය, රුපියල, පන්සල්
(4) නැට්ටුවා, වැත්තෑව, සීලිම, රූපාවලිය

(11) ''සොරෙකු සමග මිත්‍ර වී සිටි ගැහැනියක් තවුසාණන්ට හිරි හැර කළා ය'' මෙම වාක්‍යයේ අනුක්ත පදය හා උක්ත පදය පිළිවෙළින් යොදා ඇති වරණය තෝරන්න.
(1) සොරෙකු, ගැහැනියක් (2) ගැහැනියක්, තවුසාණන්ට
(3) සොරෙකු, තවුසාණන්ට (4) ගැහැනියක්, හිරිහැර

(12) 'කාන්තාවට' යන ශබ්ද ප්‍රකෘතියත් 'ගුගුරනවා' යන ධාතු ප්‍රකෘතියේත්, ප්‍රකෘතිය වෙන් කළ විට නිවැරදි වරණය වන්නේ,
(1) කාන්තාව, ගුගුරන (2) කාන්තා, ගුගුර
(3) කාන්තාවක්, ගුගුරු (4) කාන්තාව, ගුගුර

(13) A - කර්ම විභක්තිය = ශිෂ්‍යයා ගුරුවරයා කරා පැමිණ සමාව අයැදී ය.
B - කරණ විභක්තිය = කම්කරුවා වැඩ බිමෙන් ගෙදර යයි.
C - සම්බන්ධ විභක්තිය = මේ අපේ රටයි.
D - සම්ප්‍රදාන විභක්තිය = ළමයි පාසලේ සිටිති.

ඉහත විභක්ති, උදාහරණ සමග ගැළපූ විට නිවැරදි වරණය වන්නේ,
(1) A හා D ය. (2) B හා C ය. (3) A හා C පමණි (4) B හා D පමණි

(14) මුලින් දී ඇති වියරණ වර්ගයට නොගැළපෙන පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.
(1) අර්ධ ස්වර - ය,ර,ල,ව (2) වර්ගාන්ත අනුනාසික්‍ය - ඞ,ණ, න, ම
(3) ලඝු ස්වර - ඉ, ඍ, එ, ඔ (4) අඝෝෂ ව්‍යඤ්ජන - ක,ඡ, ය, ථ

(15) ''දිගු කලක් තුළ ඉතා සෙමින් සිදුවන වෙනස'' යන යෙදුම සඳහා වඩාත් සුදුසු තනි පදය වන්නේ.
(1) විපර්යාසය (2) සර්වකාලීන (3) චිරස්ථායි (4) පරිණාමය

(16) "ඈ ඉඟටිය ලෙළවා දුටුවන් මවිතයට පත් කරවන මනහර රැඟුමක් ඉදිරිපත් කළා ය." යන වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදයක් වන්නේ,

(1) ඉඟටිය (2) දුටුවන් (3) මනහර (4) රැඟුමක්

(17) යුගල උඩු කොමා හා තනි උඩු කොමා නිවැරදි ව දක්වා ඇති වරණය වන්නේ මින් කුමක් ද?

(1) මම "මනුතාපය" කියවා ඇත්තෙමියි 'ඈ කීවාය'

(2) "මම 'මනුතාපය' කියවා ඇත්තෙමි"යි ඈ කීවාය.

(3) 'මම' "මනුතාපය" කියවා ඇත්තෙමි' යි ඈ කීවාය.

(4) "මම 'මනුතාපය' කියවා ඇත්තෙමියි ඈ කීවාය"

(18) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අනංගයා - මල් සැව්, අහස - නුබ, අශ්වයා - හය, අම්මා - දිනිති

(2) නෙළුම්මල් - රත්සර, ගිමන - සරතැස, උපත - පහළවීම, උතුම් - වර

(3) ඇස - ලෝචන, ආලෝකය - කාන්ති , ඉක්මන - නොලස, උපද්‍රව - පීඩා

(4) සිරිකත - විදුරවි, කතාව - අන්දරය, ගින්දර - අනල, බිරිඳ - පියඹ

(19) යමක පවත්නා ස්වාභාවික තත්ත්වය ඉක්මවා උත්කර්ෂයෙන් යුතු ව වර්ණනා කිරීම හඳුන්වන්නේ,

(1) අතිශයෝක්තිය. (2) උපමාලංකාරය.

(3) ස්වභාවෝක්තිය. (4) උත්ප්‍රේක්ෂාලංකාරය.

(20) විරුද්ධාර්ථවත් පද යුගලයක් නො වන්නේ කුමක් ද?

(1) වියෝජන - සංයෝජන (2) ප්‍රතික්ෂේප - ප්‍රතිග්‍රහණය

(3) කඨින - මෘදු (4) ප්‍රතිරෝධ - පිරිපත

(21) දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් ළංවන කාර්යයන් සමඟ බැඳී නො පවත්නා පද පේළිය තෝරන්න.

(1) කුඩලිගම, කේයස්, මීමන ප්‍රේමතිලක, මහගමසේකර

(2) මහා පරාක්‍රමබාහු, මහසෙන්, වසබ, 1වන මුගලන්

(3) ඩී.එස්. සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ජේ.ආර්. ජයවර්ධන, ඩඩ්ලි සේනානායක

(4) තෝමස් අල්වා එඩිසන්, ජෝන් ලොගී බෙයාර්ඩ්, ආතර් ශ්‍රි ක්ලාක්, ආතර් වී දියෙස්

◆ අංක 22 සිට 23 තෙක් ඇති ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස සහිත වරණය තෝරන්න.

(22) සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියට උන් වහන්සේ අනුපමේය සේවයක් කළ සේක.

(1) විකාශනයට (2) සංගායනාවට

(3) ග්‍රන්ථකරණයට (4) බොහෝ කල් පැවතීමට

(23) ශේක්ස්පියර්, 'ටුවෙල්ත් නයිට් ඕ වට් යූ විල්,' යන නාටකයෙහි කරන විවරණය ලෝකයත් ලෝ දහමත් මනුෂ්‍යත්වයත් පිළිබඳ ඔහුගේ ගැඹුරු අවබෝධය මෙයයි පවසන දෘෂ්ටාන්තයක් වැන්න.

(1) නිදසුනක් (2) සමානත්වයක් (3) විරෝධා කල්පයක් (4) දක්මක්

(24) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නො වන පදයක් සහිත උත්තරය තෝරන්න.

(1) සමාස - නුසුදුසු,මුතුදත්, මුනිපුද, තාරපති,

(2) තද්ධිත - ඉහළ, පැනිකි, පාපීය, වනාහි

(3) කෘදන්ත - බලනු, නැටීම, කැවිලි, හිඟමන්

(4) ක්‍රියා - බලතොත්, දුවන, කරව, නටත්

(25) **වැරදි** අදහස සහිත වාක්‍යය තෝරන්න.

(1) උච්චාරණයේ දී හුස්ම වේගයෙන් පිටවන නිසා 'ඃ' යන පදය 'විසර්ගය' නමින් හැඳින්වේ.

(2) දිවේ අග කොටස මූර්ධය හෙවත් මුදුන වෙත සමීප වීම නිසා උපදින ශබ්ද මූර්ධජ වේ.

(3) ඍ, ර්, ෂ්, යන මූර්ධජ අකුරුවලට පරව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරයයි

(4) කර්තෘ කාරක වාක්‍යයක කර්තෘ අනුක්ත වන නිසා එම අනුක්ත කර්තෘට අනුව ආඛ්‍යාතය තැබිය යුතු ය.

(26) A - එකිනෙක

B - වියළිඟුරු

C - දෑ ගුල්

D - මල්ලුයන

ඉහත ප්‍රකාශ අතුරින් පරස්වර සහ ස්වරාදේශ සන්ධියට අයත් නිවැරදි අක්ෂර සහිත වරණය වන්නේ,

(1) A හා D ය. (2) B හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

(27) දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි පැරණි කාව්‍ය ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) දා ස ව ස ත ර (2) ණ ක සි මි ළු වි ය

(3) රි බා කු ර පැ ම් සි ත (4) ය ක ශේ ව්‍ය කා ර ම

◆ **අංක 28, 29 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

(28) නිවැරදි දේ නොකොට නිෂ්ඵල අනුවණ ක්‍රියාවල යෙදීම

(1) දේසේ හැටියට බාසේ කිවුවාලු

(2) අලි යන කපොලු තිබෙද්දී කූඹි යන තව් වහනවා වගේ

(3) දූලි පිහියෙන් කරවල කපනවා වගේ

(4) අතීසාරයට අමුඩෙ ගහන්නා වගේ

(29) මිතුරු බවක් පෙන්වා හතුරුකම් කිරීම

(1) ඌරන් කැකුණ තළන කොට හබන් කුකුළන්ට මඟුල් ලු.

(2) කැලේ මාරු උණාට කොටියාගේ පුල්ලි වෙනස් වෙන්නේ නෑ

(3) ඉස අතගා ඇහැ ඉගිල්ලීමක් වගේ,

(4) ඇමක් දීලා මාළුවෙකු අල්ලනවා වගේ

(30) A - බ්‍රහ්ම සහව්‍යතාව - බ්‍රහ්මයා සමඟ සබඳතා නොපැවැත්වීම

B - ව්‍යාඛ්‍යාන - අර්ථ විවරණ ග්‍රන්ථ

C - කාබොනේසියස් - අංගාර අන්තර්ගත තැන්පතු

D - තිස්පැය - දිනකින් අර්ධයක්

A, B, C, D යන යෙදුම් යුගල අතුරෙන් නිවැරදි යුගල වන්නේ,

(1) A හා B පමණි. (2) B,C,D පමණි.

(3) B,D පමණි. (4) A,B, C පමණි.

- **අංක 31, 32 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

(31) (1) බුත්සරණ පොළොන්නරු යුගයේ රචනා කරන ලැදැ'යි සැලකෙති.
(2) සේවකයන් හොඳින් වැඩ කළහ'යි අපි විශ්වාස කළෙමු.
(3) දේශපාලඥයෝ හා මිනිසුන් රැස්වීමට පැමිණියහ.
(4) ශිෂ්‍යාවෝ ලැජ්ජාවෙන් යුතු ව නැටුම් පවත්වනු ඇත.

(32) (1) මම නොහොත් නුඹලා ක්‍රීඩා කරන්නෙහු.
(2) අවතැන් වූවෝ කැටුව නිළධාරීහු කඳවුරුවලට එති.
(3) ළමයින් පස් දෙනෙක් එතෙර සංචාරයක යෙදුණේය.
(4) නුඹලා සමඟ මම  කිසි දිනක සටන් නොකරමු.

(33) A - පරවැඩ ....... ධර්මපාල තුමා සිය ජීවිතය කැප කළේ ය.
B - එදා........ අදවන තුරු කිසිවෙක් රැස්වීමට නොපැමිණියහ.
C - .................. සියල්ලෝ ම සතුටින් විසිරී ගියහ.
D - අම්මා .............. ආදරය ඇති කෙනෙකු තව ම හමු වී නැත.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
E තරම්  F පිණිස  G ඉක්බිති  H පටන්
(1) F, H, G, E  (2) E, F, G, H  (3) H, G, E, F  (4) F, E, G, H

(34) පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය තෝරන්න.
'' එහාට මෙහාට පනිමින් සිටි සැක කරුවෝ ඔක්කෝම පොලිස් දැලට අහු වුණා''
(1) පනිමින් සිටි සැකකරුවෝ සියල්ලන් ම පොලිස් දැලට අසු විණ.
(2) එහාට පනිමින් සිටි සැකකරුවන් සියල්ලෝ ම පොලිස් දැලට අසු වූහ.
(3) කට්ටි පනිමින් සිටි සැකකරුවෝ සියල්ලෝ ම පොලිස් දැලට අසු වූහ.
(4) කට්ටි පනිමින් සිටි සැකකරුවන් සියල්ලන් ම පොලිස් දැලට අසු වූහ.

(35) දුකට කියන කවි සීපද, ධීවරී ගීතය , සූරිය මල, වස්සානේ යන පද්‍ය පන්ති නිර්මාණය කළ ලේඛකයන් වන්නේ,
(1) මහගමසේකර, කේයස්, විමල් දිසානායක , ගුණදාස අමරසේකර
(2) මහගමසේකර , කේයස්, පරාක්‍රම කොඩිතුවක්කු, රත්න ශ්‍රී විජේසිංහ
(3) මොනිකා රුවන් පතිරණ, රුවන් බන්දුජීව, ඇස් මහින්ද හිමි, රත්න ශ්‍රී විජේසිංහ
(4) ඒ. වී. සුරවීර, ඩබ්ලිව් ඒ. සිල්වා, අරිසෙන් අහුබුදු , විමල් දිසානායක

(36) ධීවර කටයුතු ආශ්‍රිත බස් වහරේ ''පන්න කරනවා'' යනු,
(1) මාළු විකිණීමයි  (2) බිළී බෑමයි  (3) ඔරු දියත් කිරීමයි.  (4) මසුන් මැරීමයි.

(37) ''මිනිහට බඩගිනි නැතිව ඇති, මෙච්චර වෙලා ම සම්ප්‍රදාය කෑවා'' යන දෙබස් ඛණ්ඩය ඇතුළත් නාට්‍ය කුමක් ද?
(1) තලමල පිපිලා  (2) හුණුවටයේ කතාව
(3) සිංහ බාහු  (4) සුභ සහ යස

(38) ''වතින් සොමි සඳ වූ
රන් ලිය සිරින් බඳ වූ
තෙනෙන් රන් පෙඳ වූ
දියණියන් තම ළඟට කැඳ වූ''

මෙම පද්‍යයේ මුහුණ, ශරීරය , පියයුරු, උපමා කොට ඇති නිවැරදි වරණය තෝරන්න.

(1) සෞම්‍ය සඳ, රන් පර්වතය, පන්දම
(2) සෞම්‍ය සඳ, රන්වැල, රන් පන්දු
(3) සෞම්‍ය සඳ, රන් ගස්, රන් පියාපත්
(4) සෞම්‍ය සඳ, රන් කාන්තාව, රන් පළිඟු

(39) පහත සඳහන් කවියෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

''සපෙක් එකකු කැව නසිනේ ඔහු ම වද
අනෙක් ලොවින් නො නැසෙයි සතෙකුත් එකද
පසක් දුදන පබු කන මුව ළං කළ ද
වගක් නැසෙයි වැනසෙයි එමතු ද ඔහු ද''

(1) සර්පයෙක් කෑ තැනැත්තා මිය යයි. කේලමක් කී විට ද සිදුවන්නේ එයයි.
(2) වැදගත් අයගේ මුවට ළං වීම සර්පයෙක් දෂ්ට කිරීමට සමාන වේ.
(3) කෑ තැනැත්තා හැර අන් අය මිය යන්නා සේ ප්‍රභූන්ට කේළම් කීමෙන් මතු තමාත් නැසේ.
(4) සර්පයා කෑ තැනැත්තා හැර අන් අය මිය නොයති. කේලම් කීමෙන් පරපුරක් නසී.

(40) පහත පාඨයේ අදහසට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

''නිර්මාණ කරුවාගේ සාහිත්‍ය මෙවලම භාෂාවයි. සිතේ හටගන්නා අදහස් හැඟීම් ඒ හරහා ප්‍රකාශ කරන අතර විද්‍යාඥයා භාවිත භාෂාව නිශ්චිතාර්ථ දන වුව ද සාහිත්‍යකරුවා ධ්වනි පූර්ණ බස් වහරක් භාවිත කරයි''.

(1) සිතේ හැඟීම් බස හරහා ලබා දීමට නිර්මාණකරුවෝ නිතර ම උත්සාහ ගනිති.
(2) මනෝභාවයන් බස හරහා දීමේ දී විද්‍යාඥයා නිශ්චිතාර්ථව ද සාහිත්‍ය කරුවා ධ්වනිපූර්ණව ද භාවිතයට ගනී.
(3) නිර්මාණයක මාධ්‍ය, භාෂාව වන අතර විද්‍යාඥයාට වඩා සාහිත්‍යකරුවාගේ බස වෙනස් ය.
(4) විද්‍යාඥයා හා සාහිත්‍යකරුවා නිශ්චිතාර්ථව ද ධ්වනි පූර්ණව ද බස අවියක් කර ගනිති. ඒ නිසා එය ධ්වනි පූර්ණ වේ.